# මිනිසා හා සෞඛ්‍යය




මිනිසා හා සෞඛ්‍යය අතර සමීප සම්බන්ධතාවක් පවතී. සෞඛ්‍ය කෙරෙහි අප දක්වන සැලකිලිමත් භාවය, යහපත් සමාජයක පැවැත්ම උදෙසා බෙහෙවින් හේතු සාධක වෙයි.

මනුෂ්‍ය සමාජයේ යහපත උදෙසා 'සෞඛ්‍ය රැකගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව ලෝක ප්‍රජාවේ අවධානය යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය බිහි විය. 1948 දී ආරම්භ කරන ලද මෙම සංවිධානයෙන් සිදු වූ වැදගත් සේවාවන් කීපයක් නම් වසූරිය තුරන් කිරීම (1971), ප්‍රාථමික සෞඛ්‍යය සංරක්ෂණය පිළිබඳ අල්මා ආටා ප්‍රකාශනය (1978), ඒඩ්ස් රෝගය මර්ධනය කිරීමේ ලෝක වැඩසටහන ආදිය හැඳින්විය හැකි ය. ලෝක සෞඛ්‍යය සංවිධානය දියත් කළ ක්‍රි. ව. 2000 දී සැමට සුවසෙත නමින් හැඳින් වූ ලෝක ව්‍යාප්ත ව්‍යාපාරය, සංවිධානයේ සාමාජික රටවල් විසින් පිළිගනු ලැබුව ද, අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම පිළිබඳව සෑහීමකට පත් වීමට නොහැකි වීමේ වගකීම එම සාමාජිකයන් වෙත ම පැවරීමට සිදු වීම කනගාටුවට කරුණකි. කෙසේ වුව ද යහපත් සෞඛ්‍යයෙන් පිරි සමාජයක් කෙරෙහි ලෝක සෞඛ්‍යය සංවිධානයේ බලාපොරොත්තු අවතක්සේරු කළ නොහැකි ය.

ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්ව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ළදරු හා මාතෘ මරණ සිදු කරන රෝග මර්ධනය කර ගැනීම ලොවේ බොහෝ රටවලට හැකියාව ඇති විය.

එසේම ළමා සෞඛ්‍යය සංරක්ෂණ වැඩසටහන මගින් සෑම දරුවකුට ම ශක්තිමත්ව හා සෞඛ්‍ය සම්පන්නව වැඩීමට උපකාර කරන කරුණු හතරක් කෙරෙහි ආධාර කිරීමට ද එම සංවිධානයේ අවධානය හා සහයෝගය ලබා දී තිබේ. එම කරුණු නම්,

(1) දරුවන් ගේ වැඩීම පිළිබඳව වර්ධනය නිසි ලෙස සටහන් කර ගැනීමේ වැදගත්කම

(2) විජලනය වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම

(3) මව් කිරි පානය උනන්දු කරවීම හා නිසි වයසේ දී අතිරේක ආහාරවලට හුරු කිරීමේ අවශ්‍යතාව

(4) ප්‍රතිශක්තිකරණය වේ.

ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළ මගින් මහජනතාවට සෞඛ්‍ය පහසුකම් ලබාදීමට ද සංවිධාන කටයුතු කර යි. කෙසේ වුවත් ලෝක ජනගහනයෙන් බිලියනයකට වැඩි සංඛ්‍යාවක් දිළිඳු බවෙන් හා විවිධ රෝග පීඩා ආදියෙන් පෙළෙන බව නිරීක්ෂණය කර ඇති බැවින් මනුෂ්‍ය සමාජයේ සෞඛ්‍යය කෙරෙහි තව තවත් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි වේ.

ලොව සෑම රටකින් ම පාහේ සෞඛ්‍යය තේමා කරගත් මුද්දර කීපයක් හෝ නිකුත් කර ඇත්තේ එහි ඇති වැදගත්කම හේතුවෙනි. ඒ අතරින් නවසීලන්තය සෑම වර්ෂයක දී ම 'සෞඛ්‍යය' තේමා කරගත් මුද්දර නිකුත් කරයි. ඔවුන් ගේ ප්‍රථම 'සෞඛ්‍යය' මුද්දරය 1929 දී නිකුත් කර තිබේ.

ශ්‍රී ලංකාව ද සෞඛ්‍යය තේමා කරගත් මුද්දර අවස්ථා කීපයක දී ම නිකුත් කර තිබේ. 1988 දී ලෝක සෞඛ්‍ය සංවිධාන 40 වන සංවත්සරය, 1985 දී ළමා සෞඛ්‍යය සංරක්ෂණය හා වර්ධනය සහ 1985 ප්‍රසව විද්‍යාව හා ස්ත්‍රී චිකිත්සාව පිළිබඳ 10 වැනි ආසියානු හා සාගරික සමුළුව ආදිය ඉන් කීපයකි.

වර්ල්ඩ් විෂන් පදනම හා ක්‍රියාත්මක කළ 'තරුණයා හා සෞඛ්‍ය' වැඩසටහන වෙනුවෙන් 1993 දී නිකුත් කළ මුද්දරය ද විශේෂිත එකකි. එම වැඩසටහන මගින් සෞඛ්‍ය අධ්‍යාපනය හා සන්නිවේදන ව්‍යාපෘතීන් හි වැදගත්කම අවධානය කිරීම ඉතා අගය කළ යුතු ය. ❑

*අනුර සමරවීර*

## මුද්දර විනෝදය



මුද්දරයට ඇලුම් කරන පාඨකයා වෙනුවෙන් මුද්දර විෂයය අළලා ලියැවුණු මුල්ම සිංහල කෘතිය මුද්දර විනෝදයයි.

බොහෝ කාලයක පටන් මුද්දර පිළිබඳ විවිධ තොරතුරු ඔබ වෙත ලබා දෙන අනුර සමරවීර මෙම කෘතියේ කර්තෘවරයායි.

මෙම ග්‍රන්ථය ලොව වටිනා මුද්දර හඳුනාගත හැකි වර්ණ ඡායාරූප, ඉපැරණි මුද්දර, රූප සටහන්, තැපෑලේ ඉතිහාසය, මුද්දරයේ උපත, රටවල් හඳුනාගැනීම, මුද්දර රැස්කරන ක්‍රම, මුද්දර පවුලේ සාමාජිකයින්, වාර්තා තැබූ මුද්දර, උපකාරක පොත්, මුද්දර ආරක්ෂාකර ගැනීමට උපදෙස්, දුර්ලභ මුද්දර, මුද්දර හා අන්තර්ජාලය, මුද්දර ශබ්දකෝෂය ඇතුළු මුද්දර පිළිබඳව ඔබට ප්‍රයෝජනවත් හරවත් තොරතුරු රාශියකින් යුක්ත ය.